### වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (TRI)

### තලවකැලේ

# ඇබෑර්තු

තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේ (TRI) අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියාවේ විස්තරය :**

ආයතනයේ සියලුම පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් හා පරිපාලන හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වගකීම දරනු ලබන අතර, ආයතනයේ කාර්යය මණ්ඩලය සඳහා නායකත්වය හා ධෛර්ය ලබාදිය යුතුය.

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පළමුවන පංතිය හෝ දෙවන පංතිය ඉහළ පෙළ විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු වසර හතරක (04) විශේෂ උපාධියක් සහ අදාළ විෂයයන්ගෙන් දර්ශන විශාරද (PhD) උපාධියක්.

සහ

අවම වශයෙන් වසර විස්සක (20) කළමනාකරණ තලයේ පර්යේෂණ පළපුරුද්ද සහ පිළිගත් ආයතනයක කළමනාකරණ පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර දොළහක් (12) ක් දර්ශන විශාරද උපාධිය ලබා ගැනීමෙන් පසුව විය යුතු අතර, සතුට කළ සේවා කාර්යය කාලයක් සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වසර පහක (05) පළපුරුද්ද තිබිය යුතුය.

සහ

බහු ශික්ෂණ පර්යේෂණ විද්‍යාඥයින් / ව්‍යාපෘති විද්‍යාඥයන් සහිත කණ්ඩායම්වලට නායකත්වය හා දිශානතිය ලබාදිය හැකි සතුට කළ හැකියාව තිබිය යුතු අතර, නියමාකාර ලෙස මානව හා වෙනත් සම්පත් සේවයේ යෙදවීම හා කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධ පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමකි.

**අභ්‍යන්තර :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් දෙවන පංතියේ ඉහළ පෙළ විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු වසර හතරක (04) විශේෂ උපාධියක් සහ අදාළ විෂයයන්ගේ දර්ශන විශාරද (PhD) උපාධියක් **සහ TRI** ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ – පර්යේෂණ / ව්‍යාපෘති ලෙස වසර පහක (05) සතුටුදායක සේවයක් **හෝ** අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී / ප්‍රධාන උපදේශ නිලධාරී තනතුරක සතුටුදායක වසර අටක (08) සේවය

**හෝ**

විද්‍යා/කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග වසර දෙකක (02) පශ්චාත් පර්යේෂණ උපාධියක් සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ දර්ශන විශාරද උපාධියක් **සහ TRI** ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස වසර තුනක (03) සතුටුදායක සේවය **හෝ** නියෝජ්‍ය අධ්‍යක්ෂ – පර්යේෂණ / ව්‍යාපෘති ලෙස වසර පහක (05) සතුටුදායක සේවය **හෝ** අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී / ප්‍රධාන උපදේශක නිලධාරී ලෙස වසර අටක (08) සතුටුදායක සේවය.

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD. ALL RIGHTS RESERVED.

සහ

බහු ශික්ෂණ පර්යේෂණ විද්‍යාඥයින් / ව්‍යාපෘති විද්‍යාඥයන් සහිත කණ්ඩායම් සඳහා නායකත්වය හා දිශානතිය ලබා දිය හැකි සතුට කළ හැකියාව තිබිය යුතුය. නියමාකාර ලෙස මානව හා වෙනත් සම්පත් සේවයේ යෙදවීම හා කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධ පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමකි.

**වැටුප් පරිමාණය :**

HM 2-3(2016) රුපියල් 98,215 - 12X2,700 - රුපියල් 130,615 (මසකට)

මූලික වැටුප වන රුපියල් 98,215/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ (2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 88,021/- වේ)

**වයස :**

අවුරුදු 40 නොඅඩු විය යුතු අතර, අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් ප්‍රතිලාභ :**

i.) තලවකැලේ, තේ පර්යේෂණ ආයතනය තුළ සම්පූර්ණ ගෘහභාණ්ඩ සහිත නිල නිවාස ලබාදේ.
ii.) ආයතනයේ දැනට පවත්නා වෛද්‍ය යෝජනා ක්‍රමයෙහි නියමයන් ප්‍රකාරව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.
iii.) සේවක අර්ථසාධක අරමුදල : තෝරාගත් අයදුම්කරු විසින් තම මාසික වැටුපෙන් 10% මුදලකින් කාර්යය මණ්ඩල අර්ථ සාධක අරමුදලට දායක විය යුතු අතර, ආයතනය විසින් ඒ සඳහා 15% දායකත්වයක් දරනු ඇත. තවද, ආයතනය විසින් සේවක භාර අරමුදලට ද 3% දායකත්වයක් ලබා දෙනු ඇත.
iv.) නේවාසික කම්කරු ඒකක හතරක් (අභ්‍යන්තර දෙකක් හා බාහිර දෙකක්) ලබාදේ.
v.) පවත්නා රජයේ රෙගුලාසි ප්‍රකාරව, පත්වීම ලබන්නාගේ අභිමතය පරිදි, නාමික ගෙවීමකින් යුත් සීමිත පෞද්ගලික පරිහරණය සඳහා වාහනයක් ලබාදේ.
vi.) තනතුරට අදාළ අනෙකුත් ප්‍රතිලාභද හිමිවේ.

මෙම තනතුර ස්ථිරය. **සම්පූර්ණ ජීව දත්ත** හා අයදුම්කරු පිළිබඳ සොයා බැලිය හැකි ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව හා අදාළ අධ්‍යාපනික හා පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් සමග වූ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත **2019 මාර්තු 31** වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ. මෙම අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයුරින් යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට අවකාශ ඇත. එසේම අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අවශ්‍ය වැඩිදුර විස්තර සඳහා කරුණාකර තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමු වන්න.

**සභාපති,**
**තේ පර්යේෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**

Source: Silumina, Sunday Observer (2019.03.17)